**ජාතික ආරක්ෂක අරමුදල - 2018**

**-------------------------------------------**

**1.1 <u>තත්ත්වාගණනය කළ මතය</u>**

ජාතික ආරක්ෂක අරමුදලේ 2018 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අරමුදලේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 <u>තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම</u>**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 <u>මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්</u>**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙමෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

**1.4** **<u>මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම</u>**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 <u>මූල්‍ය ප්‍රකාශන</u>

### 1.5.1 <u>මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය</u>

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරිබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම් කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 <u>ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම</u>

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අරමුදලේ කාණ්ඩ 04 ක් යටතේ දක්වා තිබුණු වටිනාකම රු.මිලියන 55.63 ක්වූ ස්ථාවර වත්කම් සටහන් කිරීමට ලේඛණයක් පවත්වාගෙන ගොස් නොතිබීම හේතුවෙන් විගණනයේදී වත්කම් සත්‍යාපනය කිරීමට නොහැකි විය. | ස්ථාවර වත්කම් සටහන් කිරීමට මෙතෙක් කාලයක් ලේඛණයක් පවත්වාගෙන ගොස් නොමැති අතර 2019 වර්ෂයේ සිට විධිමත් පරිදි ලේඛණයක් පවත්වා ගැනීමට කටයුතු කර ඇත. | ස්ථාවර වත්කම් ලේඛණ ගත කර එම ලේඛණ යාවත්කාලීනව පවත්වාගෙන යා යුතුය. |

### 1.5.3 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ආදායම් වියදම් ගිණුමේ ගොඩනැගිලි ක්ෂය හා කාර්යාල උපකරණ ක්ෂය වශයෙන් රු.232,600 ක් දක්වා තිබුණු නමුත් ඊට අදාල උපලේඛනයේ එම අගය රු 141,914 ක් ලෙස දැක්වුණි. තවද ගණනය කිරීමේ දෝෂයක් හේතුවෙන් වර්ෂය සඳහා වූ ගොඩනැගිලි ක්ෂය රු.226,000 කින් වැඩියෙන් ප්‍රතිපාදනය කර තිබුණි. | ගොඩනැගිලි පිරිවැය මත හා පරිගණක උපාංග සරල මාර්ගිකව ක්ෂය කිරීම් කර ඇති අතර ලෙජරයේ සටහන් කිරීමේදී ප්‍රමාද දෝෂයක් සිදුවී ඇත. | ශේෂ නිසි පරිදි සැසඳීම් කර ඉදිරිපත් කළ යුතුය. |

## 1.6 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2014 ඔක්තෝබර් 17 දිනැති 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය හා මුදල් රෙගුලාසි 756 | අරමුදල සඳහා සමාලෝචිත වර්ෂය අවසානයේ භාණ්ඩ සමීක්ෂණය සිදු කර එම සමීක්ෂණ මණ්ඩල වාර්තා 2019 මාර්තු 17 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | 2019 වර්ෂයේ සිට භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදු කොට අදාල වාර්තා ඉදිරිපත් කරනු ලැබේ. | 2014 ඔක්තෝබර් 17 දිනැති 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය සහ මු.රෙ 756 අනුව කටයුතු කල යුතුවේ. |

## 1.7 මුදල් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අරමුදල විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ පවත්වාගෙන යනු ලබන ජංගම ගිණුමේ 2018 ජනවාරි මාසයේ සිට ජුනි මාසය දක්වා රු.මිලියන 01 ක මුදල් ශේෂයක් හා අගෝස්තු මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා රු.මිලියන 96 ක සිට රු.මිලියන 39 ක් දක්වා පරාසයකින් වූ ශේෂයක්, ඵලදායී ආයෝජනයකින් තොරව පැවැති බව නිරීක්ෂණය විය. | මෙත් සෙවන නිවාස ප්‍රතිලාභීන්ට මුදල් ගෙවීම සඳහා මෙම මුදල ශ්‍රී ලංකා මහ බැංකුවේ ඇති ජංගම ගිණුමට මාරු කරන ලද අතර, ගෙවීම් කටයුතු වාරික වශයෙන් සිදුවන බැවින් මෙම මුදල ගිණුමේ රඳවා තබාගෙන ඇත. | මූල්‍ය අවශ්‍යතා හා වියදම් දැරීම විධිමත්ව සැලසුම් කර ඊට අනුකූලව කටයුතු කල යුතුය. |
| (ආ) | අරමුදල විසින් සමාලෝචිත වර්ෂය තුළ ආපසු ලබාගෙන තිබුණු බැංකු ස්ථාවර තැන්පතු 02 ක් සම්බන්ධයෙන් පිළිවෙලින් දින 48 කට හා දින 34 කට අදාල පොළී මුදලක් බැංකුව විසින් අරමුදල වෙත බැරකර නොතිබුණි.ඒ සම්බන්ධයෙන් පසු විපරම් කටයුතු අරමුදල විසින් සිදුකර නොතිබුණි. | 'මෙත් සෙවන' අර්ධ නිවාස ව්‍යාපෘතියේ ප්‍රතිලාභීන්ට වාරික මුදල් ගෙවීම සඳහා මෙම ස්ථාවර තැන්පතු යොදවා ගැනීමට තීරණය වූ බැවින් ප්‍රතිආයෝජනය නොකල අතර, එම කාල සීමාවන් සඳහා බැංකුව විසින් පොළී ලබා දී නොමැත. | විධිමත් මූල්‍ය අවශ්‍යතා සැලැස්මක් යටතේ ආයෝජිත මුදල් ආපසු ගැනීම් සිදුකල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 87,869,226 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.95,979,932 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහිරු. 183,849,158 ක පිරිහීමක් නිරීක්ෂණය විය. ආදායම රු. 18,351,161 කින් ඉහළ ගියද මෙත් සෙවන නිවාස සඳහා වියදම රු.199,937,335 කින්ද, පරිපාලන වියදම රු. 1,997,075 කින් හා විරු සිසු ප්‍රදීප සඳහා වියදම රු. 4,000,000 කින් වැඩිවීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1985 අංක 09 දරන ජාතික ආරක්ෂක අරමුදල් පනත අනුව ජාතික ආරක්ෂාව ප්‍රවර්ධනය කිරීමට සහ සහතික කිරීම සඳහා අරමුදල් උපයෝජනය කල යුතු බව සඳහන් වුවද ඒ සඳහා සමාලෝචිත වර්ෂය තුලදී වැඩසටහන් සැලසුම් කර ක්‍රියාත්මක කර නොතිබුණි. | ජාතික ආරක්ෂාව ප්‍රවර්ධනය හා සහතික කිරීම යන අරමුණු ඉතා සංවේදී කාරණා බැවින් අතිගරු ජනාධිපතිතුමාගේ හා පාලක මණ්ඩලයේ උපදෙස් මත එවැනි වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරනු ලැබේ. | 1985 අංක 09 දරන ජාතික ආරක්ෂක අරමුදල් පනතේ අරමුණු අනුව කටයුතු කළ යුතුය |
| (ආ) | 1985 අංක 09 දරන ජාතික ආරක්ෂක අරමුදල් පනතේ 09 වන වගන්තිය ප්‍රකාරව තම රාජකාරී ඉටුකරන අතර තුර තුවාල ලැබූ හෝ මියගිය පොලිස් නිලධාරීන්ගේ යම් සාමාජිකයන්ගේ පවුල් වලටද සහන සැලසිය යුතු වුවත් ප්‍රතිලාභ ගෙවීමේදී ඒ පිළිබඳව සලකා බලා නොතිබුණි. | විරු සුමිතුරු ව්‍යාපෘතිය මගින් පොලිස් නිලධාරින් වෙනුවෙන් ප්‍රමාණවත් තරම් ප්‍රතිලාභ ලබා දී ඇති බව නිරීක්ෂණය වූ බැවින් නිවාස ප්‍රතිලාභ ලබා දී නොමැත. විරු සිසු ප්‍රදීප ශිෂ්‍යාධාර පොලිස් නිලධාරින්ගේ දරුවන්ට ලබා දී ඇත. නිවාස ප්‍රතිලාභ අවශ්‍යතාවක් ශ්‍රී ලංකා පොලීසිය වෙතින් ලදහොත් පාලක මණ්ඩලයේ අනුමැතිය මත ප්‍රතිලාභ ලබා දීමට කටයුතු යෙදීමට අපේක්ෂා කෙරේ. | 1985 අංක 09 දරන ජාතික ආරක්ෂක අරමුදල් පනතේ 09 වන වගන්තිය අනුව කටයුතු කළ යුතුය. |

## 3.2 ව්‍යාපෘති වැඩ ප්‍රමාදයන්

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සේවයේ යෙදී සිටියදී මියගිය හෝ ආබාධිත බවට පත්වූ රණවිරුවන් සඳහා අඩක් නිමකල නිවාස වල ඉතිරි වැඩ සම්පූර්ණ කිරීම සඳහා රු.250,000 බැගින් අදියර තුනකින් ආපසු අය නොකරන රු. 750,000 ක මූල්‍ය පරිත්‍යාගයක් ලෙස ලබාදීමේ මෙත් සෙවන නිවාස ව්‍යාපෘතිය යටතේ ත්‍රිවිධ හමුදා රණවිරුවන් 145 දෙනෙකු සඳහා ප්‍රතිලාභ ලබාදීමට 2017 අගෝස්තු මාසයේදී සැලසුම් කර තිබුණු නමුත් සමාලෝචිත වර්ෂයේදී එම රණවිරුවන් සංඛ්‍යාව 300 ක් දක්වා සංශෝධනය කර තිබුණි.කෙසේ වෙතත් පාලක මණ්ඩලය අනුමැතිය ලබා දී තිබුණු ප්‍රතිලාභී රණවිරුවන්ගේ සංයුතිය පසු අවස්ථා වලදී අනුමැතියෙන් තොරව වෙනස් කර තිබුණි. තෝරාගත් රණවිරුවන් සියළු දෙනා සඳහා පලමු වාරිකය ගෙවා තිබුනද සමාලෝචිත වර්ෂයේ අවසානයට රණවිරුවන් 07 දෙනකුට දෙවන වාරිකයද, රණවිරුවන් 44 දෙනකුට තෙවන වාරිකයද ගෙවා නොතිබුණි. | නව ව්‍යාපෘතියක් සමග පාලක මණ්ඩලයේ අනුමැතිය මත කඩිනමින් ක්‍රියාත්මක කර 2019 වර්ෂය තුල අවසන් කර ඇත. ප්‍රතිලාභියා විසින් නිවස ඉදිකර ගෙන ඇති ප්‍රමාණය අනුව ඉතිරි කොටස් ඇස්තමේන්තු කර ප්‍රතිලාභ ලබා දෙන ලදි. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියල කර ඒ අනුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කල යුතුය. ප්‍රතිලාභීන් සංඛ්‍යාව තෝරාගැනීම ඇගයීම් ක්‍රියාවලියෙන් පසුව සිදු වන බැවින් සංයුතිය පසුව වෙනස්නොකල යුතුය. |

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 වගන්තිය ප්‍රකාරව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන්වී දින 60 ක් ඇතුලත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 15 දින ඉදිරිපත් කර තිබුණි. | ජාතික ආරක්ෂක අරමුදලේ මූල්‍ය ප්‍රකාශනය 2019 පෙබරවාරි 28 දින විගණනය වෙත යොමු කළ අතර විධිමත් ලෙස පාලක මණ්ඩලයේ සභාපතිවරයා ඇතුළු සාමාජිකයින්ගේ අත්සනින් නැවත ඉදිරිපත් කරන ලෙස දැන්වූ බැවින් එම අඩුපාඩු සම්පූර්ණ කිරීමේදී ප්‍රමාදයක් සිදුවිය. ඉදිරියේදී ප්‍රමාදයකින් තොරව මූල්‍ය ප්‍රකාශනය ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16.2 වගන්තිය ප්‍රකාරව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමග කාර්යසාධන වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වුවද, අරමුදල විසින් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | ඉදිරියට කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශනයක් සකස් කොට ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16.2 වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 4.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2014 පෙබරවාරි 17 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2014 ප්‍රකාරව 2018 වර්ෂය සඳහා දිගුකාලීන දැක්මක් සහිතව අදාල පනතේ සඳහන් අරමුණු සාක්ෂාත් කර ගැනීම ඉලක්ක කරගත් ක්‍රියාකාරකම්, අරමුදලේ සංවිධාන ව්‍යුහය, අනුමත සහ තත්‍ය කාර්ය මණ්ඩලය, වාර්ෂික ක්‍රියාකාරකම් සඳහා වන අරමුදල් අවශ්‍යතා සැලැස්ම, ආදී කරුණු ඇතුළත් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් අරමුදල විසින් පිළියෙල කර නොතිබුණි. | සංක්ෂිප්ත ක්‍රියාකාරී සැලස්මක් සකස් ඉදිරිපත් කර ඇත. | 2014 පෙබරවාරි 17 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2014 ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර ඉදිරිපත් කළ යුතුය. |

## 4.3 අයවැය පාලනය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04.1 (ඇ) වගන්තිය අනුව අරමුදල විසින් වාර්ෂික අයවැය ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | 2019 වර්ෂයේ සිට අයවැය ලේඛණය පිළියෙල කිරීමට උපදෙස් ලබාදෙන ලදී. | 2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය. |

**4.4** <u>තිරසර සංවර්ධන අරමුණු</u>

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
| --- | --- | --- |
| 2017 අංක 19 දරන ශ්‍රී ලංකා තිරසර සංවර්ධන පනත හා ජනාධිපති ලේකම්ගේ 2018 මාර්තු 16 දිනැති අංක පීඑස්/එස්පී/එස්බී/3/201 දරන ලිපිය අනුව අරමුදල විසින් තිරසර සංවර්ධන පනත පිළිබඳ දැනුවත්වී එම අරමුණු කරා ලගාවීමට අවශ්‍ය ඉලක්ක හඳුනාගෙන එම ඉලක්ක මැනීම සඳහා දර්ශක හඳුනාගෙන නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු පිළිබඳව දැනුවත් වී ඒ අනුව එම අරමුණු ළගා කර ගැනීමට අවශ්‍ය කටයුතු යෙදීමට ඉදිරියේදි අපේක්ෂා කෙරේ. | ජනාධිපති ලේකම්ගේ 2018 මාර්තු 16 දිනැති අංක පීඑස්/එස්පී/එස්බී/3/201 දරන චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය. |